# ආයුර්වේද වෛද්‍ය විද්‍යායතන පුස්තකාලයවල එකතුව වර්ගීකරණය හා වින්‍යාස කිරීමේ ගැටලු පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

ආනන්ද තිස්ස ආර්.ඩී.
ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය, කැලණිය විශ්වවිද්‍යාලය, යක්කල.

**සංක්ෂිප්තය**

විවිධ ක්ෂේත්‍රවලට අයත් දේශීය වෛද්‍ය විද්‍යා දැනුම් සම්භාරය වාචනා මාධ්‍යයෙන් හා ලිඛිත ස්වරූපයෙන් පරම්පරාවෙන් පරම්පරාවට උරුම වූවකි. ග්‍රන්ථාරූඪ වූ ලිඛිත දැනුම අධ්‍යයන, අධ්‍යාපන හා පර්යේෂණ අවශ්‍යතා සඳහා විශ්වවිද්‍යාලය පුස්තකාලයවලට ආබද්ධ කරගෙන ග්‍රන්ථ එකතුවක් වශයෙන් සංවිධාන කෙරේ. අපරදිග සංකල්ප අනුව භාවිත කෙරෙන වර්ගීකරණ ක්‍රම ආධාරයෙන් 'ආයුර්වේද වෛද්‍ය විද්‍යායතන පුස්තකාලයවල එකතුව පාඨක අවශ්‍යතා සඳහා වර්ගීකරණය හා වින්‍යාස කිරීම' මගින් ආයුර්වේද ග්‍රන්ථයන්හි අන්තර්ගත විෂය නිශ්චිත අන්දමින් නිරාවරණය නොවේ. පූර්වෝක්ත තත්ත්වයන් අධ්‍යයනය කිරීම පර්යේෂණයේ ගැටලුව යි. පර්යේෂණ අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ, ආයුර්වේද වෛද්‍ය විද්‍යා විෂයක කෘති වර්ගීකරණ කාර්යයේ දී මතු වන ගැටලු විමර්ශනය හා විශ්ලේෂණය කොට ඒ සඳහා වඩාත් යෝග්‍ය වර්ගීකරණ ක්‍රමයක අවශ්‍යතාව පෙන්වාදීම යි. ඩිවී දශම වර්ගීකරණයේ වෛද්‍ය විද්‍යා වර්ග පංතියේ විද්‍යමාන වන අඩුපාඩු ද විමර්ශනය කෙරේ. දත්ත රාශිකරණය සඳහා ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය, දේශීය වෛද්‍ය විද්‍යායතනය හා බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණ ආයතනීය පුස්තකාලයන්හි එකතුව නියැදිය වශයෙන් භාවිත කරනු ලැබේ. පර්යේෂණයට භාජිත නියැදියෙන් දත්ත රාශිකරණය පිණිස අදාළ පුස්තකාලය නිරීක්ෂණය, ක්ෂේත්‍ර අධ්‍යයනය, වර්ගීකාරකවරුන් හා පුස්තකාලයාධිපතිවරුන් සමග සම්මුඛ සාකච්ඡා පැවැත්වීම හා ද්විතීයික දත්ත සම්පාදනයේ දී මූලාශ්‍රය අධ්‍යයනය, සාහිත්‍ය විමර්ශනය හා ගවේෂණය පාදක විය. රාශිකෘත දත්ත, සංස්කරණය කිරීමෙන් පසු විස්තරාත්මක පර්යේෂණ ක්‍රමය අනුව විශ්ලේෂණය කෙරිණි. පර්යේෂණ අධ්‍යයනයෙන් හෙළි වූ කරුණු අනුව එළඹුණු ප්‍රධාන නිගමන කීපයකි. එනම්, (අ) නියැදියට අදාළ පුස්තකාලයවල භාවිත කෙරෙන වර්ගීකරණය ආයුර්වේද විෂය වර්ගීකරණයට ඇති හැකියාව අවම මට්ටමක වීම, (ආ) අපරදිග වෛද්‍ය විද්‍යාව නිරූපණය කෙරෙන වර්ග පංතියෙන් පෙරදිග ආයුර්වේද වෛද්‍ය විද්‍යාව නිශ්චිත අන්දමින් නිරාවරණය නොවීම, (ඇ) දේශීය වෛද්‍ය විද්‍යාව සම්බන්ධයෙන් ඇති අඩු තක්සේරුව හේතුවෙන් ආයුර්වේද සංකල්ප විස්තාරණය කිරීමට ඇති අවකාශය අල්ප වීම. පූර්වෝක්ත වර්ගීකරණ ගැටලු විසඳීමේ ක්‍රියාමාර්ග වශයෙන් (අ) 'ආයුර්වේද වෛද්‍ය විද්‍යාවේ විෂය සංකල්ප මැනවින් නිරූපණය කෙරෙන පෙරදිගට ගැලපෙන නව්‍ය වර්ගීකරණ ක්‍රමයක් සැලසුම් කිරීම හා භාවිත කිරීම', (ආ) ශ්‍රී ලංකාවට සුදුසු **'ආයුර්වේද වෛද්‍ය විද්‍යා වර්ගීකරණ ප්‍රතිපත්තියක්'** හා ඊට අදාළ **'මෙහෙයුම් පද්ධතියක්'** කෙටුම්පත් කිරීම, (ඇ) යෝජිත නව වර්ගීකරණය පුස්තකාලය ස්වයංක්‍රීයකරණය සඳහා යොදාගනු ලබන විවෘත මෘදුකාංග සමග භාවිත කිරීමේ හැකියාවෙන් සංයුක්ත වීම යන යෝජනා ඉදිරිපත් කෙරේ.

**ප්‍රමුඛ පදඃ** ආයුර්වේද වෛද්‍ය විද්‍යාව, දැනුම සංවිධානය, පුස්තකාලයාධිපතිත්වය, පුස්තකාලය ග්‍රන්ථ වර්ගීකරණය

**විද්‍යුත් ලිපිනයඃ** agathisi@yahoo.com, rdatissa@gmail.com